# 23 පොදු යැදුම්

යාච්ඤාව දෙවියන් වහන්සේ සමග ප්‍රේමයෙන් බැඳී කෙරෙන සුහද සාකච්ඡාවකි. මෙම සාකච්ඡාව සඳහා ක්‍රම දෙකක් භාවිත කළ හැකි ය.

1. කට පාඩම් කරගත් යාච්ඤා භාවිත කිරීම
2. තමන් විසින් ම නිර්මාණය කළ යාච්ඤා භාවිත කිරීම.

අප ම නිර්මාණය කර ගන්නා යාච්ඤා එසේ නැති නම් යැදුම් තුළින් අපේ ම හදවතින් නැගී එන සිතුම් පැතුම් අවංකව ම දෙවියන් වහන්සේට ප්‍රකාශ කළ හැකි ය. එමගින් අප හා දෙවියන් වහන්සේ අතර ඇති සබඳතාව වැඩි වර්ධනය වේ. එය ගැඹුරු යාච්ඤා දිවියකට මග පාදනු ඇත.

මෙවන් යාච්ඤා ක්‍රමයකට අප හුරුවන තුරු ශුද්ධ වූ සභා මාතාව සකස් කර දී ඇති පොදු යැදුම් බෙහෙවින් ම අපට වැදගත් වේ. එම යැදුම්වල ප්‍රයෝජන කිහිපයකි.

- යාච්ඤා කිරීමට හුරුවක් ලැබීම
- යාච්ඤා නිර්මාණයට මග පෙන්වීමක් ලැබීම
- පොදුවේ යාච්ඤා කරන විට ශබ්ද නගා සියලු දෙනාට ම උච්චාරණය කළ හැකි වීම
- පෞද්ගලික යාච්ඤාවේ දී පවා භාවිත කළ හැකි වීම.

විශ්වාස ලක්ෂණය, තුන්කාලයේ ආරාධනාව, පාස්කු කාලයේ තුන්කාලයේ ආරාධනාව, දයාධික මනස්ථාපය එවැනි පොදු යැදුම් කිහිපයකි. මෙබඳු යාච්ඤා භාවිත කිරීමට නම් ඒවා නිවැරදි ව කට පාඩම් කර ගත යුතු ය. අන් අය සමග එකට එකතු වී එම යාච්ඤා උච්චාරණය කිරීමේ දී;

- සමූහයක් වශයෙන් එකට එක් ව
- ශබ්ද නගා
- ඉතා පැහැදිලි ව
- නිවැරදි වේගයෙන්
- විශ්වාසයෙන්
- නිවැරදි ඉරියව් භාවිත කරමින්
- අවධානයෙන් යුතු ව කීම වැදගත් ය.

# අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

- අප විසින් විශ්වාස කළ යුතු සත්‍යතා දොළහක් අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණයෙහි අඩංගු වේ.
- එය අපගේ විශ්වාසයේ සාරාංශයකි.
- අපේ විශ්වාසය ප්‍රකාශ කරමින් මෙම යාච්ඤාව කියනු ලැබේ.



23.1 රූපය

1. අහස පොළව මැවූ සර්ව බලධාරී වූ පිතාවන දෙවියන් කෙරෙහි ද,





23.2 රූපය

2. ඔහුගේ ඒකපුත්‍ර වූ අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් කෙරෙහි ද විශ්වාස කරමි.



23.3 රූපය

3. මොහු ස්ප්‍රීතු සාන්තු විසින් ගැබ වැස කන්‍යා මරිය තුමියගෙන් උපන්නාහ.



23.4 රූපය

4. පෝන්සියෝ පිලාත් හට යටහත් ව වද විඳ කුරුසියේ ඇණ ගැසුම් කා උකුත් වී තැන්පත් කරන ලද්දාහ.



23.5 රූපය

5. පාතාලවලට බැස තුන්වන දා මළවුන් කෙරෙන් උත්ථාන කර වදරා,



23.6 රූපය

6. පරමණ්ඩලවලට නැඟී සර්ව වල්ලභ වූ දෙවි පියාණන්ගේ දකුණු පාර්ශවයෙහි වැඩ සිටින්නාහ.



23.7 රූපය

7. එහි සිට ජීවතුන්ටත් මළවුන්ටත්, නඩු වදරන්නට වඩින්න ය,



23.8 රූපය

8. ශුද්ධාත්මයාණන් කෙරෙහි ද



23.9 රූපය

9. සාධාරණ සාන්ත සභාවෙහි ද සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභයෙහි දි



23.10 රූපය

10. පාප ක්ෂමාවෙහි ද



23.11 රූපය

11. මාංශොත්ථානයෙහි ද



23.12 රූපය

12. අනන්ත ජීවිතයෙහි ද විශ්වාස කරමි. ආමෙන්

## තුන් කාලයේ ආරාධනාව

- දේව පුත්‍රයාණන් වූ ජේසුස් වහන්සේ මිනිසත් බව ගෙන මරියතුමියගේ කුසෙහි පිළිසිඳ ගැනීම හෙවත් ජේසුස් වහන්සේගේ මාංශගතවීම මෙම යාච්ඤාව තුළින් සිහිගන්වයි.

- දිනපතාම පෙ.ව. 5.30ට, මධ්‍යහ්න 12.00ට හා ප.ව. 6.30ට මෙම යාච්ඤා උච්චාරණය කරනු ලැබේ.



23.13 රූපය - දේව දූතයා මරියතුමියට මංගලම් කීම.

ස්වාමීන්ගේ දූතයා මරිය තුමියට සැළ කෙළේ ය. එවිට ස්ප්‍රීතු සාන්තු විසින් ගර්භණී වුණා ය.

නමෝ මරියනි ....................

මේ මම ස්වාමින් වහන්සේගේ දසීමි. ඔබ කී වචනය ලෙස මට සිදු වේවා!

නමෝ මරියනි ................

වචන තෙම ද මාංශ වුණේ ය.  අප සමග ද වාසය කෙළේ ය.

නමෝ මරියනි ...............

ප්‍ර. ක්‍රිස්තු තුමන්ගේ වාක්දතවලට අප හේතුවන්ත වන ලෙස
උ. කන්‍යා ශුද්ධ වූ දේව මාතාවෙනි, අප නිසා යාච්ඤා කළ මැනව.

යාච්ඤා කරම්හ

ස්වාමිනි, සුරදූතයා සැලකළ වචනයෙන් ඔබගේ පුත්‍ර වූ ක්‍රිස්තු තුමන්ගේ මනුෂ්‍යයා වීම දැනගත්තා වූ මේ අපි, එතුමන්ගේ දුක් ප්‍රාප්තිය හා කුරුසියන් උදෙසා මෝක්ෂ ප්‍රතාප මහිමතාවෙන් මාංශෝස්ථානය ලබන ලෙස, අපගේ ආත්ම ඔබගේ කරුණා ප්‍රසාදයට හේතු යුක්ත කොට වදළ මැනව.

මේ කී දේ අපේ ස්වාමී වූ ජේසුස් ක්‍රිස්තුන් උදෙසා ම ලැබේවා!  ආමෙන්.

(ත්‍රිත්ව ස්තෝත්‍රය තුන් වරක් උච්චාරණය කියන්න.)

**පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව**

- මෙම යාච්ඤාව ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ ව සිහි කරනු ලබන යාච්ඤාවකි
- ආලේලුයියා සෙනසුරාදා දින සිට ශුද්ධාත්මයාණන්ගේ මංගල්‍යය දින සවස දක්වා තුන්කාලයේ ආරාධනාව උච්චාරණය කරනු වෙනුවට පාස්කු කාලයේ තුන්කාලයේ ආරාධනාව උච්චාරණය කරයි.

පරලෝක රාජේශ්වරිනි, ආනන්ද සන්තෝෂ වේවා - ආලේලූයියා

ඒ කිම්දයත් ඔබගේ ශ්‍රී කුසෙහි වාසය කරන්නට
අභිප්‍රාය කළ සේක - ආලේලූයියා

තමන් වහන්සේ පෙර වදාළ ප්‍රකාරයෙන් නැගිට වදාළ සේක - ආලේලූයියා

අප නිසා දෙවියන්ට යාච්ඤා කළ මැනව - ආලේලූයියා

කන්නිමරිය තුමියෙනි, ආනන්ද සන්තෝෂ වේවා - ආලේලූයියා.

ඒ කිම්දයත් ජේසු ස්වාමිදරුවෝ සැබවින් ම නැගී වදාළ සේක - ආලේලූයියා.

යාච්ඤා කරම්හ

සර්වේශ්වර වූ දෙවියනි, ඔබගේ පුත්‍ර වූ ක්‍රිස්තු තුමන්ගේ මාංශෝත්ථානයෙන් ලෝකය සන්තෝෂ කරන්නට කරුණා අභිප්‍රාය කර වදාළ වේ ද? ඔවුන් වහන්සේගේ මාතාවන් වන කන්‍යා මරිය තුමිය උදෙසා අපට අනන්ත කාල සතුටු සිත් දෙවා වදාළ මැනව.

මේ කී දේ අපේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් උදෙසා ම ලැබේවා! ආමෙන්.

(ත්‍රිත්ව ස්තෝත්‍රය තුන් වරක් උච්චාරණය කරන්න)

## දයාධික මනස්ථාපනය

- අප ප්‍රේම කරන්නා වූ දෙවි පියාණන් වහන්සේට ප්‍රතිප්‍රේමය නොදක්වා ඔවුන් වහන්සේට විරුද්ධ ව කළ පාපි ක්‍රියාවන්ට කරන සමාව අයදිමින් උච්චාරණය කරන යාච්ඤාවකි.
- පාපෝච්චාරණ අවස්ථාවේ දී පව් කමාව ලබා ගැනීමට ප්‍රථම උච්චාරණය කරන යාච්ඤාවකි.



23.14 රූපය - පාපෝච්චාරණය කරන අවස්ථාවකි.

මාගේ දෙවියනි, මම ඔබ වහන්සේට අනදර කළ නිසා බොහෝ සේ වික්ෂෝප වෙමි. මාගේ පාපවලින් මා සදා කාල නිරාගින්නට හිමි වූ හෙයින් ද මාගේ දයාබර ජේසුස් ක්‍රිස්තු ස්වාමි දරුවන් කුරුසියේ ඇණ ගැසු හෙයින් ද විශේෂ කොට සර්ව දයා යහපත්කම් ඇත්තා වූ ඔබට අනදර කළ හෙයින් ද සියලු දේට වඩා ඒවාට වෛර කරමි. මා කළ සියලු පාපවලට මාගේ මුළු හෘදයෙන් ක්ෂමාව ඉල්ලමි. ඔබ වහන්සේගේ පිහිටෙන් මින් මතු පව් නොකර සිටින්නටත් පව් ප්‍රස්තාවලින් වැළකී සිටින්නටත් ඒකාන්තයෙන් ම පොරොන්දු වෙමි. ආමෙන්.

අපි අපගේ දිනපතා යැදුම් අවස්ථාවන්හි මෙවන් පොදු යාච්ඤා භාවිත කරමින් දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරමු.

**ක්‍රියාකාරකම**

(1). පොදු යැදුම් භාවිතයෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(2). පහත දැක්වෙන යාච්ඤා තුළින් ඉස්මතු වන එක් සුවිශේෂ කරුණක් බැගින් ලියන්න.

- අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය
- දයාධික මනස්ථාපනය
- පාස්කු කාලයේ තුන්කාලයේ ආරාධනාව

(3). ඔබ දන්නා වෙනත් පොදු යාච්ඤා **පහක්** නම් කරන්න.



***ජීවිතයට බිඳක්***

***හිරු කිරණින් ඇරඹී - සැඳසිසිලෙන් නිමාවන සෑම දිනක හැකි සෑමවිට ම පොදු යැදුම් සමඟින් දෙවිඳුන් පසසන්නට නැඹුරු වෙමු.***